# බොන්සායි ප්‍රදර්ශණය කිරීමේදී සැලකිය යුතු කරුණු කිහිපයක්:

ප්‍රදර්ශණයක් සඳහා බොන්සායි නිර්මාණයක් ඉදිරිපත් කරන විට අප විසින් සැලකිය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. විශේෂ අවස්ථාවක් ලෙස සලකා, එහි පෙනුම හා කලාත්මක බව වැඩි දියුණු කිරීම කෙරෙහි අප සැලකිලිමත් විය යුතුයි. විශේෂයෙන්, තර  යක් සඳහා නිර්මාණ ඉදිරිපත් කරණ විට මෙම කරුණු වඩාත් වැදගත් වෙනවා. විනිශ්චය කරුවන්, ඉදිරිපත් කර ඇති නිර්මාණ අතරින් හොඳම ඒවා තේරීමේදී, මෙම කරුණු ගැන සැලකිලිමත් වෙනවා.

ප්‍රදර්ශණයට ඉදිරිපත් කරණ බොන්සායි ශාඛ මනා පෙනුමකින් යුක්ත විය යුතුයි. මූලික වශයෙන්, ඒ සඳහා පහත දැක්වෙන කරුණු බල පානවා.

1. ශාඛය නියමිත හැඩරුවට අනුකූලව, නියමිත ප්‍රමිතියකට සකසා තිබීම
2. ශාඛය සිටුවා තිබෙන බඳුනෙහි සුදුසු බව
3. ශාඛයේ නිරෝගී බව හා මනාව වැඩුනු අතු, පත්‍ර ආදිය,
4. ශාඛයේ හා බඳුනෙහි පිරිසිදු බව, වල් පැල වලින් තොරව මනා බිම් වැස්මකින්     යුක්ත වීම

අපි මේ එකින් එක ගැන සවිස්තරව සලකා බලමු.

## 1.

අප දන්නා පරිදි, ඒ ඒ හැඩතලවලට අදාලව පිළිපැදිය යුතු යම් නීති රීති තිබෙනවා. එම නීති සකසා තිබෙන්නේ, ශාඛයේ හැඩරුව මනාව පිළිබිඹු වන අයුරින්.

- මූලික වශයෙන්, ප්‍රධාන කඳ ගසේ මුල සිට අග දක්වා, ක්‍රමයෙන් සිහින් වන අයුරින් තිබිය යුතුයි.
- ගසේ පහලින් ඇති අතු ඉහලින් ඇති අතු වලට වඩා මහත් විය යුතුයි.
- ගසේ මුල් කිහිපයක් මනාව දෙපසට විහිදෙන අයුරින් පෙනෙන්ට තිබිය යුතුයි. මුල් එකිනෙක හරස් ලෙස හා අවුල් සහගත ලෙස විහිදී නොතිබිය යුතුයි.
- ඉදිරිපස පෙනුමෙහි, ප්‍රධාන කඳ ගසේ උසින් 2/3 ක් පමණ වන තුරු පෙනෙන්නට තිබිය යුතුයි.
- හැකි පමන, අතු අතර පරතරයක් පෙනෙන ලෙස සකස් විය යුතුයි.
- අතු දෙකක් එකිනෙක හරහා නොයා යුතුයි.
- අතු දෙකක් , කඳෙහි එකතැනකින් නොවිහිදිය යුතුයි.
- ඉදිරිපස පෙනුමෙහි, ප්‍රධාන කඳ හරහා යන පරිදි අතු නොවිහිදිය යුතුයි.

- ගසේ අතු ත්‍රිමාණ ව විහිදිය යුතුයි. ගසේ දෙපැත්තට පමනක් අතු විහිදී තිබෙන විට ගසේ අවශ්‍ය පරිදි ගැඹුරු පෙනුමක් දිස් වන්නේ නැහැ.

- ගසෙහි හැඩය දල වශයෙන් ත්‍රිකෝණාකාර විය යුතුයි.

ප්‍රදර්ශණයට මාස කිහිපයකට කලින් මේ කරුණු නිසි පරිදි සම්පූර්ණව ඇත්දැයි නවත වරක් පිරික්සා බලා අවශ්‍ය නිවැරදි කිරීම් කල හැකියි. තමන්ගේ ශාඛය, බිත්තියක් හෝ සුදු පැහැ තිරයක් ඉදිරියේ තබා මේ ගැන විමසිලිමත් වන්න පුළුවන්.

## 2.

බොන්සායි ගසක් සම්පූර්ණ වන්නේ බඳුනත් සමග ගත් විටයි. කොතරම් හොඳින් සැකසූ ගසක් වුවත්, නුසුදුසු බඳුනක සිටු වීමෙන්, එහි ඇති මුළු පෙනුමම විනාශ වෙන්න පුළුවන්. ශාඛයේ හැඩතලයට අනුරූප බඳුනක් තෝරා ගත යුතු අතර, එහි විශාලත්වය ගැන විශේෂයෙන් සැලකිය යුතුයි.

වඩාත්ම වැදගත් කරුණ වන්නේ, බඳුන , ශාඛයේ පෙනුම තවත් වැඩි දියුණු කරන්නට එයට අනුබලයක් හැමියට මිස, බඳුනේ අලංකාරය කැපී පෙනෙන අයුරින් , තද පාට හෝ විසිතුරු සහිත ව තෝරා නොගත යුතු වීමයි. සාමාන්‍යයෙන්, ගුරු පැහැය හෝ කොල පැහැයට හුරු පාට තෝරා ගත හැකියි. සිමෙන්ති බඳුන් යොදා ගන්නා විට, එබඳු පාටකින් පින්තාරු කර ගත හැකියි. මෙහිදී, දිලිසෙන එනමල් තීන්ත වෙනුවට එමල්ෂන් තීන්ත යොදා ගත හැකියි. කලින් තීන්ත ගෑ බඳුනක් ප්‍රදර්ශණයට පෙර නැවත පින්තාරු කර ගන්නේ නම් වඩාත් සුදුසුයි.

බඳුනේ ප්‍රමාණය, ශාඛයේ විශාලත්වයට අනුරූප ව තීරණය කළ යුතුයි. ශාඛයේ ප්‍රමාණයට, වඩා වි ශාලවූ හෝ කුඩාවූ බඳුනක් තෝරා ගැනීමෙන් කොතරම් හොඳින් සැකසූ ශාඛයක පෙනුම වුවත් මුළුමනින්ම විනාශ විය හැකියි.

## 3.

ප්‍රදර්ශණයට තබන හැම ශාඛයක්ම, නිරෝගී විය යුතුයි. දිලීර හෝ කාමි උවදුරු වලට ගොදුරු වූ පැල, දැකුම් කළු නොවන බව අමුතුවෙන් කිව යුතු නැති අතර, එබඳු පැල මගින් ප්‍රදර්ශණයට ගෙනෙනු ලබන අනෙකුත් පැල වලටද, රෝග බෝවෙන්ට පුළුවන්.

හොඳින් ක්‍රමානුකූලව පොහොර යෙදීමෙන්, හොඳ පෙනුම ඇති පත්‍ර ලැබෙනවා. ප්‍රදර්ශණයට මාස 3 කට පමණ පෙර, නිසි හැඩතලය ලැබෙන පරිදි ශාඛය කප්පාදු කිරීම සුදුසුයි. යම් ශාඛයක් නැවත බඳුන් ගත කිරීම අවශ්‍ය නම්, මේ අවස්ථාවේදීම එයත් කල හැකියි.

සමහර ශාඛවල පත්‍ර සියල්ලම ඉවත් කිරීමෙන් අළුත් පැහැපත් පත්‍ර ලබා ගත හැකියි. මෙහිදී , ශාඛය ගැන හොඳ අවබෝධයක් ඇතිව එය කළ යුතුයි. අලුතින් පත්‍ර වැඩීමට ගත වන කාලය, සියළුම පත්‍ර ඉවත් කිරීම ශාඛයට සුදුසුද යන වග සලකා බැලිය යුතුයි.

අප බොහෝ විට කරන වරදක් නම් ප්‍රදර්ශණයට පෙර වැඩියෙන් පොහොර යෙදීමයි. එමගින් වන්නේ ගසේ සුපුරුදු වැඩීමේ වේගය හෙවත් රිද්මය වෙනස්වී, අනවශ්‍ය පරිදි වැඩීම, පත්‍ර අනවශ්‍ය පරිදි විශාල වීම, වැනි කරුණු නිසා, ශාඛයේ අලංකාරයට බාධා පැමිණීමයි. එනිසා මෙහිදී කල යුත්තේ ප්‍රදර්ශණයට පෙර මාස කිහිපය තුල , නියමිත පරිදි පොහොර යොදමින්, නිසි කප්පාදු කරමින්, ශාඛයේ හැඩය හා වැඩීම නියමිත පරිදි පවත්වා ගැනීමයි.

4.

කඳෙහි හෝ අතුවල යොදා ඇති කම්බි, ප්‍රදර්ශණයට පෙර ඉවත් කළ යුතුයි.

කලින් සඳහන් කල අයුරින්, සිමෙන්ති බඳුන් ප්‍රදර්ශණයට කලින් පින්තාරු කර ගැනීම වඩාත් සුදුසුයි. පිටත එනමල් ආවරණයක් සහිත මැටි බඳුන් , දිය සෙවෙල, දූවිලි වලින් තොරවන ලෙස මනාව සෝදා ගත හැකියි.

ශාඛයේ ප්‍රධාන කඳ සහ පස මතුපිට ඇති මුල් වල බොහෝ විට දිය සෙවෙල බැදීම සිදු වෙනවා. මෙම කොටසද, පරන දත් බුරුසුවක් හෝ පින්සලක් උපයෝගී කර ගෙන පිරිසිදු කොට සෝදා හරින්න පුළුවන්.

පසේ ආවරණයක් ලෙස යොදන පාසි වැනි දේ මික කාලයකදී දුර්වර්ණ වෙනවා, එසේ වී ඇති නම්, ඒවා වෙනුවට, අලුත් බිම් ආවරණයක් යෙදීමෙන්, ප්‍රදර්ශණයට තබන පැල වල පෙනුම දියුණු කර ගත හැකියි.

ශාඛය ප්‍රදර්ශණයට තබන්නට පෙර, එහි ඇති වියලි හෝ දුර්වර්ණ වූ පත්‍ර ඉවත් කිරීම සුදුසුයි. පස මතු පිට ට වැටී ඇති වියළි පත්‍රද ඉවත් කල යුතුයි.

ගසෙහි පත්‍ර එකම ප්‍රමාණයකට තිබෙනවානම් වඩාත් සුදුසුයි. ප්‍රමාණයට වඩා විශාල පත්‍ර අතරින් පතර තිබේ නම් ඒවා ඉවත් කල හැකියි.

තිරස් අතට විහිදුණු අතු වලින් පහලට ඇති පත්‍ර හැකි පමණ ඉවත් කල හැකියි. එමගින් අතුවල වි හිදීම හොඳින් පෙන්වන්න පුළුවන්.

තමන්ගේ ශාඛය සහිත බඳුන ලී හෝ වෙනත් ආධාරකයක් මත තැබීමෙන්, එහි පෙනුම තවත් වැඩි කර ගත හැකියි. මෙහිදීද සැලකිය යුතු කරුණ වන්නේ, එබඳු ආධාරකයකට අනවශ්‍ය අවධානයක් නොයන පරිදි සුදුසු ආධාරකයක් තෝරා ගත යුතු බවයි.

එම්,ඒ . පේමසිරි